සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2001 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2001 ஆகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2001

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

| 21 | |
|---|---|
| S | II |

පැය එකයි / ஒரு மணித்தியாலம் / One hour

www.pastpaperlk.com

## I කොටස

විභාග අංකය ..............................

සැලකිය යුතු යි :

මෙම කොටසෙහි ප්‍රශ්න 20 ක් ඇත. ඒ සියලු ප්‍රශ්න අනිවාර්ය වේ.
එක් ප්‍රශ්නයකට ලකුණු 02 ක් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු 40 ක් හිමි වේ.
බහුවරණ ප්‍රශ්නවල නිවැරදි පිළිතුර / පිළිතුරු යටින් ඉරක් අඳින්න.
සමහර බහුවරණ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු එකකට වඩා තිබෙන බැව් සලකන්න. ඔබ විසින් එවැනි ප්‍රශ්නවලට සියලු ම නිවැරදි පිළිතුරු හඳුනා ගත යුතු වේ.
අනෙකුත් ප්‍රශ්නවලට පිළිතුරු, දී ඇති හිස් තැන්වල ලියන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයෙහි ම සැපයිය යුතු ය.
නියමිත කාලය අවසන් වූ පසු I හා II කොටස් එක පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා ශාලාධිපතිට භාර දිය යුතු ය.

www.pastpaperlk.com

1. පුළුල් මුදල් ලෙස වර්ග කළ හැකි සංයෝග හඳුනාගන්න.
   (i) මුදල් නෝට්ටු සහ කාසි
   (ii) චලංගු මුදල් සහ වාණිජ බැංකුවල ඉල්ලුම් තැන්පතු
   (iii) චලංගු මුදල්, ඉල්ලුම් තැන්පතු සහ වාණිජ බැංකුවල ඉතුරුම් හා ස්ථාවර තැන්පතු
   (iv) බැංකු නොවන මූල්‍ය ආයතනවල ඉතුරුම් හා ස්ථාවර තැන්පතු සහ ඉහත (iii) හි ඇතුළත් දෑ

www.pastpaperlk.com

2. වාණිජ බැංකුවක් හා ඉතිරිකිරීමේ බැංකුවක් අතර පවතින වෙනස්කම් හඳුනාගන්න.
   (i) මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන්නේ වාණිජ බැංකු පමණි.
   (ii) මුදල් මැවිය හැක්කේ වාණිජ බැංකුවලට පමණි.
   (iii) විවිධ වර්ගයේ ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු තිබෙන්නේ ඉතිරිකිරීමේ බැංකුවල පමණි.
   (iv) චෙක්පත් මගින් පැවරිය හැකි ඉල්ලුම් තැන්පතු තිබෙන්නේ වාණිජ බැංකුවල පමණි.

www.pastpaperlk.com

3. මහ බැංකුවක පහත සඳහන් ක්‍රියා අතරින් මුදල් සැපයුම අඩුවීමකට හේතු වන ඒවා හඳුනාගන්න.
   (i) මහ බැංකු පොලී අනුපාතිකය පහළ දැමීම
   (ii) විවෘත වෙළෙඳපොළේ සුරැකුම්පත් විකිණීම
   (iii) වාණිජ බැංකුවල අවම සංචිත අවශ්‍යතා ඉහළ දැමීම
   (iv) වෙළෙඳ පොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම

[ අනෙක් පිටුව බලන්න.

www.pastpaperlk.com

මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(i) උද්ධමනය පාලනය කිරීම සඳහා රජයේ අයවැය හිඟය අඩු කිරීම
(ii) උද්ධමන පාලනය වැනි ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා මුදල් සැපයුම හා ණය පිරිවැය පාලනය
(iii) ප්‍රමාණවත් ද්‍රවශීලතා අනුපාත පවත්වා ගෙන යෑම සඳහා වාණිජ බැංකුවලට ණය සැපයීම
(iv) මහජනයාගේ තැන්පතුවල සුරක්ෂිත බව සහතික කිරීම සඳහා වාණිජ බැංකු කටයුතු සුපරීක්ෂණය

www.pastpaperlk.com

ඔබට **එකඟ විය නො හැකි** ප්‍රකාශ හඳුනාගන්න.

(i) ද්‍රවශීලතාවරණය යනු මුදල් සඳහා ඇති ඉල්ලුම යි.
(ii) වාණිජ බැංකුවලට ණය වශයෙන් සැපයිය හැක්කේ මහජනයාගෙන් තැ[illegible] ලැබෙන මුදල් පමණි.
(iii) වාණිජ බැංකුවක් සිය වත්කම් ව්‍යුහය තීරණය කිරීමේ දී ද්‍රවශීලතාව හා ලාභදායිතාව තුලනය කිරීමට උත්සාහ ගනී.
(iv) රජයේ, බැංකුවල සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු මහ බැංකුව බාර ගනී.

www.pastpaperlk.com

උද්ධමනයක **ආර්ථික ප්‍රතිවිපාක** හඳුනාගන්න.

(i) ඉතුරුම් දිරිගැන්වේ.
(ii) මූර්ත පොලී අනුපාතිකය වැඩි වේ.
(iii) ජීවන වියදම ඉහළ යන අතර මූර්ත වැටුප් පහළ වැටේ.
(iv) දේශීය මිල ගණන් ඉහළ යෑම නිසා ආනයන ආකර්ෂනීය වන අතර අපනයනවල තරඟකාරිත්වය හීන වේ.

www.pastpaperlk.com

කිසියම් සම්පත් ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවට **එක්කෝ** X භාණ්ඩ 80 ක් **නැතහොත්** Y භාණ්ඩ 120 ක් නිපදවිය හැකි අතර, එම සම්පත් ප්‍රමාණයෙන් ම ඉන්දියාවට **එක්කෝ** X භාණ්ඩ 200 ක් **නැතහොත්** Y භාණ්ඩ 160 ක් නිපදවිය හැකි ය. ආවස්ථික පිරිවැය ස්ථාවර යැයි උපකල්පනය කරන්න. **නිවැරදි** යයි ඔබ පිළිගන්නා ප්‍රකාශ හඳුනාගන්න.

(i) මේ දත්ත අනුව රටවල් දෙක අතර වෙළෙඳාමකට පදනමක් නැත.
(ii) ඉන්දියාවට X භාණ්ඩය සාපේක්ෂ වශයෙන් අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවිය හැකි ය.
(iii) ශ්‍රී ලංකාවට Y භාණ්ඩය සාපේක්ෂ වශයෙන් අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවිය හැකි ය.
(iv) භාණ්ඩ දෙක ම නිපදවීම සඳහා ඉන්දියාවට සාපේක්ෂ වාසියක් ඇත.
(v) ඉන්දියාව X භාණ්ඩය අපනයනය කිරීමෙන් සහ ශ්‍රී ලංකාව Y භාණ්ඩය අපනයනය කිරීමෙන් රටවල් දෙකට ම වාසිදායක වෙළෙඳමක් සිදු වේ.

www.pastpaperlk.com

ගෙවුම් ශේෂයේ **වර්තන ගිණුමක** ඔබ ඇතුළත් කරන දෑ මොනවා ද?

(i) විදේශ වත්කම් වෙනස් වීම
(ii) වර්තන සංක්‍රාම
(iii) සේවා සඳහා ගෙවීම් හා ලැබීම්
(iv) සාධක සඳහා ගෙවීම් හා ලැබීම්
(v) කෙටිකාලීන විදේශ ණය
(vi) භාණ්ඩ අපනයන සහ ආනයන
(vii) සෘජු විදේශ ආයෝජන

www.pastpaperlk.com

**මූර්ත සඵල විනිමය අනුපාතය** ඉහළ යෑමට හේතු විය හැක්කේ මේවායින් කුමන සාධකය ද?

(i) රුපියල පාවීම
(ii) ගෙවුම් ශේෂයේ හිඟයක්
(iii) මෙරට උද්ධමන අනුපාතිකය අනෙකුත් රටවල පවතින උද්ධමන අනුපාතිකයට වඩා ඉහළ මට්ටමක පැවතීම
(iv) රුපියල අමෙරිකානු ඩොලරයට සම්බන්ධ කිරීම

www.pastpaperlk.com

10. ඉදිරි දශක කිහිපය තුළ ශ්‍රී ලංකා ජනගහනය තුළ සිදුවෙතැයි අපේක්ෂිත වැදගත් වෙනස්වීම මොනවා ද?
(i) ළදරු මරණ අනුපාතය තවදුරටත් පහළ යෑම නිසා ජනගහනයේ සීඝ්‍ර වැඩිවීමක්
(ii) ජනගහනය සීඝ්‍රයෙන් වයස්ගත වීම
(iii) ජනගහනය මෙන් ම ශ්‍රම බලකාය ද ස්ථාවර වීම හෝ අඩුවීමක්
(iv) වයස අවුරුදු 15 සහ ඉන් පහළ වයස් කාණ්ඩයට අයත් ජනගහනයේ පැහැදිලි වැඩිවීමක්

11. (i) 1998-99 කාලයේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතිකය.......................ප්‍රමාණ විය.
(ii) 1998-99 කාලයේ දී ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය.......................ප්‍රමාණ විය.

12. නූතන ආර්ථිකයක වර්ධනයට වඩාත් ම දායක වන සාධක දෙක හඳුනාගන්න.
(i) ජනගහන වර්ධනය
(ii) ආයෝජන අනුපාතිකයේ ඉහළ යෑම
(iii) ආනයන ආදේශනය
(iv) නව තාක්ෂණය
(v) විවෘත ආර්ථික ප්‍රතිපත්ති
(vi) රාජ්‍ය ව්‍යවසායන්

13. රටක ආර්ථික සංවර්ධන මට්ටමේ දළ මිනුමක් වශයෙන් ඒක පුද්ගල මූර්ත දළ දේශීය නිෂ්පාදිතය භාවිත කෙරේ. මෙම මිනුම නිර්වචනය කරන්නේ කෙසේ ද?
(i) රටක වැසියන් විසින් නිපදවන ලද දළ නිමැවුම එරට මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදූ විට ලැබෙන සංඛ්‍යාව
(ii) රටක භූගෝලීය සීමාව තුළ නිපද වූ, ස්ථාවර මිල ගණන් අනුව අගය කළ, දළ නිමැවුම මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීමෙන් ලබා ගන්නා සංඛ්‍යාව
(iii) රටක දළ නිමැවුම එරට වැඩ කරන වයස්වල ජනගහනයෙන් බෙදූ විට ලැබෙන සංඛ්‍යාව
(vi) වි.ගැ.හි. ඒකක මගින් මැන දක්වෙන රටක සාමාන්‍ය ආදායම් මට්ටම

14. ණය වැනි වෙනත් ප්‍රාග්ධන ලැබීම්වලට සාපේක්ෂ ව සෘජු විදේශ ආයෝජනවල වාසි මොනවා ද?
(i) ගෙවුම් ශේෂය යහපත් කිරීමට උපකාරී වීම
(ii) ප්‍රාග්ධනය සමග නව තාක්ෂණය ලැබීම
(iii) දේශීය භාණ්ඩ සඳහා අපනයන වෙළෙඳ පොළ දියුණු කර ගැනීමට උපකාරී වීම
(vi) යටිතල පහසුකම් වැඩි දියුණු කර ගත හැකි වීම

15. පසුගිය දශක දෙකක පමණ කාලයේ දී සියයට 7-10 තරම් ඉහළ මට්ටමක ආර්ථික වර්ධන වාර්තා කර ඇති රටවල් හතරක් හඳුනාගන්න.
(i) චීනය
(ii) තායිවානය
(iii) දකුණු කොරියාව
(iv) උතුරු කොරියාව
(v) මැලේසියාව
(vi) සිංගප්පූරුව
(vii) පිලිපීනය
(viii) ඉන්දියාව
(ix) ශ්‍රී ලංකාව

16. රාජ්‍ය අයවැය හිඟය ඉහළ මට්ටමක පැවතීම මගින් වෙළෙඳ පොළ ආර්ථිකයක ක්‍රියාකාරිත්වය මත අහිතකර ප්‍රතිවිපාක ඇති කෙරෙන බව බොහෝ විට කියැවේ. එවැනි අහිතකර ප්‍රතිවිපාක හඳුනාගන්න.
(i) රජය ණය ගැනීම නිසා පෞද්ගලික ආයෝජනය සඳහා ලබාගත හැකි සම්පත් සීමා වීම.
(ii) පෞද්ගලික ව්‍යාපාරවල ලාභදායිතාව අඩුවීමකට හේතු වන පරිදි බදු අනුපාතික ඉහළ දැමිය හැකිය.
(iii) අයවැය හිඟය මුල්‍යකරණය මගින් උද්ධමන ප්‍රතිවිපාක ඇතිවිය හැකි ය.
(iv) හිඟය පියවා ගැනීමට සම්පත් සොයා ගැනීම සඳහා පාරිභෝගික සහනාධාර අඩු කිරීමට සිදුවිය හැකි ය.

17. ආර්ථික අරමුණක් වශයෙන් සාර්ව ආර්ථික ස්ථායිතාව යන්නට ඔබ ඇතුළත් කරන්නේ මොනවා ද?
(i) ඉතුරුම් සැමවිට ම ආයෝජනවලට සමාන වන සේ පවත්වා ගැනීම.
(ii) මිල ස්ථායිතාව
(iii) බාහිර ගිණුම්වල තුලනයක් පවත්වා ගැනීම
(iv) රාජ්‍ය අයවැය හිඟ වළක්වා ගැනීම

18. දුගී බව අඩු කිරීම සඳහා ගත හැකි වැදගත් වැඩ පිළිවෙල දෙකක් හඳුනාගන්න.
(i) දුප්පතුන්ට නොමිලේ ආහාර මුද්දර සැපයීම
(ii) දුප්පතුන්ගේ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා පුහුණු කිරීම තුළින් නිපුණතා වර්ධනය
(iii) නිෂ්පාදන කටයුතු සඳහා දුප්පතුන්ට ණය පහසුකම් ලබා දීම
(iv) අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනය

19. (i) 1998-99 කාලයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය.......................% ක් පමණ විය.
(ii) 1998-99 කාලයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට නිපැයුම් කර්මාන්තවල දායකත්වය .......................% ක් පමණ විය.

20. (i) 1998-99 කාලයේ දී ශ්‍රී ලංකාවේ මුළු අපනයන ඉපැයුම්වලින් .......................% ක් පමණ ලැබුණේ රෙදි සහ ඇඟළුම් වලිනි.
(ii) 1998-99 කාලයේ දී ශ්‍රී ලංකාවේ මුළු අපනයන ඉපැයුම්වලින්.......................% ක් ලැබුණේ වැවිලි බෝගවලිනි.

-----

www.pastpaperlk.com
www.artsapi.lk